# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2012/29 - 2017 මාර්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2017.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### නිවේදනයයි

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත

3 වන වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම උපලේඛනයේ I සහ II හි I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයන් හැර එම ලේඛනයේ II වැනි තීරුවෙහි අනුරූප සටහනේ සඳහන් මායිම් හා ඉම් සළකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, එම ප්‍රදේශ එම වගන්තියේ කාර්යය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

පාඨලී චම්පික රණවක (පා. ම.),
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 මාර්තු මස 14 වැනි දින.
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 සහ 18 වන මහල්,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.


මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## උපලේඛනය I

### තිස්සමහාරාම නාගරික සංවර්ධන බල ප්‍රදේශයට ගඟසිරිපුර ග්‍රාම නිලධාරි වසම ඇතුලත් කිරීම

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට්* පත්‍ර අනුව, නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කළ අංක 223/16 දරන 1982.12.17 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ වෙරළබඩ කලාපය ද, අංක 392/20 දරන 1986.03.14 දිනැති *ගැසට්* පත්‍රයේ සඳහන් ප්‍රදේශ ද, 1987.07.24 දිනැති ''ගම් උදව'' කතරගම *ගැසට්* පත්‍රයේ සඳහන් එම ප්‍රදේශ ද, අංක 747/7 දරන 1992.12.29 දිනැති රුහුණුපුර ද, ඇතුළු ප්‍රදේශවලට අමතරව දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වන්නා වූ අංක 04 ගඟසිරිපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය අයත් වන්නා වූ මෙහි I වැනි තීරුවෙන් විස්තර වන්නා වූ මුළු මහත් භූමි ප්‍රමාණය වේ.

*II වැනි තීරුව*

*උතුරට:*

අංක 38 ගැමුණුපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිමේ අවසාන ලක්ෂයෙන් පටන්ගෙන එතැන්සිට අංක 37 දෙබරවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ගිණිකොන දෙසට ගමන්කර, අංක 02 මැදවැලැන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද වේ.

*නැගෙනහිරට:*

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 02 මැදවැලැන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ නිරිත දෙසට හා අංක 06 සේනපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට ගමන්කර, අංක 07 රබර්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

*දකුණට:*

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 07 රබර්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ වයඹ දෙසට ගමන්කර, අංක 34 මොලකැප්පපතාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද වේ.

*බටහිරට:*

අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට අංක 34 මොලකැප්පපතාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ දෙසට ගමන්කර, අංක 36 පොල්ගහවැලැන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඡේදනය වන ලක්ෂ්‍ය දක්වා ද, එතැන් සිට අංක 36 පොල්ගහවැලැන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ ඊසාන දෙසට ගමන්කර, එතැන් සිට අංක 36 දරන ඉහත සඳහන් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර දෙසට ගමන්කර ආරම්භක ලක්ෂ්‍ය ඔස්සේ ගමන්කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

04 - 372

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.